ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2008/2009
අන්තර් ජාතික නීතිය - LWU 3315/4312/4335

221

කාලය පැය (3) තුනයි.

---

දිනය - 2009 අප්‍රේල් මස 03 දින වේලාව - ප.ව.09.30- ප.ව.12.30 දක්වා

---

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.
ප්‍රශ්න පහකට (05) කට පමණක් පිළිතුරු සපයන්න.

01. ස්ලෝවියා ප්‍රජාතාන්ත්‍රික ජනරජය විසින් සිය විශාලතම නෞකාව වන "සිල්වර් ස්කයි" යන නැව රාජ්‍ය විරෝධී කැරලිකාර සංවිධානයක් සමඟ සිවිල් යුද්ධයකට පැටලී ඇති ඇන්ග්‍රියා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත යවන ලදී. ගැටුම්කාරී ප්‍රදේශවල අවතැන්ව සිටින ළමුන් සඳහා සෙල්ලම් බඩු සහ ආහාර රැගෙන යාමට ඇන්ග්‍රියානු රජය විසින් එම නෞකාවට අවසර දෙන ලදී. නැව ප්‍රවාහනය කරන අතරතුරදී එහි තුවක්කු, පුපුරණ ද්‍රව්‍ය සහ නැවේ කාර්ය මණ්ඩලය තුල කැරලිකාර කණ්ඩායම් සාමාජිකයන් පිරිසක් ද ඇති බවට ඇන්ග්‍රියානු බුද්ධි අංශයට තොරතුරු ලැබුණි.

නැව ඇන්ග්‍රියානු මුහුදු සීමාවට පැමිණි විට එම රටේ නාවික හමුදාව නැවට ගොඩවී විනාඩි 20 ක් පමණ කාලයක් තිස්සේ නැව පරීක්ෂා කළේය. ඉන් අනතුරුව ඔවුහු එය පුපුරුවා හැරියහ. ස්ලෝවියාව ඇන්ග්‍රියාවේ ක්‍රියා කලාපය හෙළාදැක ඇන්ග්‍රියාවට එරෙහිව යුද්ධ ප්‍රකාශ කළේය. ස්ලෝවියාව විසින් ඇන්ග්‍රියාවට එරෙහිව යුද්ධ ප්‍රකාශ කිරීම සාධාරණීකරනය කළේ නැව විනාශ කිරීමට පසු කෙටි කාලයකදී ඇන්ග්‍රියාව විසින් උටාසියා රාජ්‍යයෙන් අවි ආයුධ මිළදී ගත් බවට චෝදනා කරමිනි.

ස්ලෝවියානු ජනාධිපති විමිසසු බැඩිලර් අසල්වැසි රාජ්‍ය වන මලූනා රාජ්‍යය සහ කමූනා රාජ්‍යයන් දෙකම ඇන්ග්‍රියාවට එරෙහිව හමුදා ප්‍රහාරයකට සම්බන්ධ වන ලෙස ආරාධනා කරන ලද්දේ එම රටවල් දෙකටද ඇන්ග්‍රියාව පහර දෙනු ඇති බව දන්වමිනි. මෙම රටවල් දෙකෙහි සහය ඇතිව ස්ලෝවියාව විසින් ඇන්ග්‍රියාවට පහර දෙන ලදී.

මලූනාවේ අසල්වැසි රාජ්‍යයක් වන රලූනා සිය රටවැසියන් විසි දෙනෙකු යුද්ධය හේතුවෙන් ඇන්ග්‍රියාවේ නිරවී සිටින බවට දැන ගත්හ. (මලූනා රාජ්‍යයේ අසල්වැසි රාජ්‍යයක් වන) රලූනා රාජ්‍යය ඔවුන්ව බේරා ගැනීමට තම හමුදාව ඇන්ග්‍රියාවට යැවීය. රලූනාවේ හමුදාව ඇන්ග්‍රියානු රාජ්‍යය තුල සටන් කරමින් සිටින අවස්ථාවේදී රලූනා ජාතිකයකු වශයෙන් හඳුනාගනු ලැබූ පුද්ගලයකු ඇත්ත වශයෙන්ම ඇන්ග්‍රියානු විරෝධී කැරලිකාර කණ්ඩායමක් වන තලූබා සංවිධානයේ

සාමාජිකයකු බවට සොයා ගත්හ. රඹුනා හමුදාව ඔහුව නිදහස් කර ගත් අතර ඔහුගේ සංවිධානයට සහය දීමට එකඟ විය. ඇන්ග්‍රියාව දැන් යුද්ධයේ උච්චස්ථානයට මුහුණ දී තිබේ. ඇන්ග්‍රියානු ජනාධිපති ඔබෙන් උපදෙස් අපේක්ෂා කරයි.

ඔහුට උපදෙස් දෙන්න.

02. (අ) "රාජ්‍යත්වයට අදාළ සම්ප්‍රදායික ජාත්‍යන්තර චාරිත්‍ර නීතියේ අවශ්‍යතා මොන්ටිවීඩියෝ සම්මුතිය මගින් සාමාන්‍ය වශයෙන් පොදුවේ පිළිගනු ලැබුවද ජාත්‍යන්තර ප්‍රජාව විසින් පිළිගෙන ඇති තවත් අදාළ කරුණු සමහරක් ඇත."

ඔබ ඉහත ප්‍රකාශය සමග එකඟ වේද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) සංවර්ධනය වෙමින් පවතින ග්‍රීන් රාජ්‍යය සහ සංවර්ධිත රටක් වන බ්ලූ රාජ්‍යය අසල්වැසි මිතුරු රාජ්‍යයන් වේ. ග්‍රීන් රාජ්‍යය සුළුතර ජනවාර්ගික කණ්ඩායමක් විසින් පවත්වාගෙන යනු ලබන සිවිල් යුද්ධයකට මුහුණ දී සිටී. වසර 11 කට වැඩි කාලයක් මෙම යුද්ධය පවති. සිවිල් යුද්ධය නිසා වර්ධනය වෙමින් පවතින මානුෂික අර්බුද සම්බන්ධයෙන් ගතයුතු පියවර පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස සිය විශේෂිත නියෝජිතයකු එවීමට බ්ලූ රාජ්‍යය ඉඳිරිපත් විය. රටවල් දෙක අතර සාකච්ඡා වාර කිහිපයක් පවත්වන ලද අතර විශේෂිත නියෝජිතයාව පිළිගැනීම ග්‍රීන් රාජ්‍යයෙහි කැබිනට් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරයි. ග්‍රීන් රාජ්‍යයේ තීරණය ඇසීමෙන් පසු බ්ලූ රාජ්‍යයේ සුළුතර ජනවාර්ගික කණ්ඩායමේ සාමාජිකයන් පිරිසක් විසින් සිය රජයට එරෙහිව දිප ව්‍යාප්ත විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. තමන්ගේ ක්‍රමයට සිවිල් යුද්ධය හසුරුවන බවත් සහ ග්‍රීන් හි ස්වාධිපත්‍යයට එරෙහි කිසිදු අතපෙවීමක් නොඉවසන බවත් ග්‍රීන් රාජ්‍යයේ ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයක් නිකුත් කරන ලදී.

සාකච්ඡා කරන්න.

03. (අ) "සෑම ස්වෛරී රාජ්‍යයක්ම අනෙකුත් ස්වෛරී රාජ්‍යයන්ගේ ස්වාධිපත්වයට ගරු කිරීමට බැඳී සිටී. එක් රටක අධිකරණයක් විසින් වෙනත් රටක රජයක් සිය රට තුළදී සිදු කරන ක්‍රියාවන් සම්බන්ධයෙන් තීන්දු ප්‍රකාශ නොකරයි. ස්වෛරී රාජ්‍යයන් තමන් අතර පවතින ක්‍රමෝපායන් මගින් එවන් ක්‍රියා සඳහා සිදුවන අගතින්ට ප්‍රතිකර්ම සපයා ගත යුතුය."
Underhill v Hemandez (1897) 168 U.S 250 at P 252

සාකච්ඡා කරන්න.

(ආ) වර්ෂ 2007 දී සයිබෝ රාජ්‍යය සඳහා රොමලානා ජනරජයේ තානාපති ලෙස ජේම්ස් මැල්කෙනන් මහතා පත් කරන ලදී. වර්ෂ 2008 ජූනි මාසයේ දී ඔහු රොමලානා අගනගරයේ සිය මෝටර් රථය පදවමින් සිටියදී මිනිසුන් හය දෙනෙකු හප්පා තුවාළ සිදු කල අතර එහිදී 12 වියැති ගැහැණු දරුවෙකු මිය ගියේය. ඔහුගේ ලේ පරීක්ෂණයේදී ලේවල මධ්‍යසාර මට්ටම 0.17 ලෙස අනාවරණය විය. ඔහු තානාපතිවරයෙකු බැවින් අත්අඩංගුවෙන් නිදහස් කරන ලදී.

රොමලානා තානාපති කාර්යාලයේ ප්‍රවෘත්ති නිළධාරියකු වූ රිනාවා, ගෝල්ඩන් හවුස් ජනාධිපති මන්දිරයේ ප්‍රවෘත්තිපත් සාකච්ජාවකට සහභාගි වෙමින් සිටියේය. ගෝල්ඩන් හවුස් හි රහස්‍ය ලිපිගොනුවක් රිනාවා විසින් සොරකම් කරන ලදී. ප්‍රවෘත්තිපත් සාකච්ජාවේදී සයිබෝ නම් පුද්ගලික මාධ්‍යයක් විසින් ඔහුව විඩියෝ ගත කරන ලදී. පසු දින සයිබෝහි රහස්‍ය සේවා දෙපාර්තමේන්තුව (එස් එස් එස් ඩී) විසින් රිනාවා අත්අඩංගුවට ගෙන ඔහුගෙන් ප්‍රශ්න කරන ලදී. මුලදී ඔහු චෝදනාව ප්‍රතික්ෂේප කල නමුදු පටිගත කර ගන්නා ලද විඩියෝ දර්ශනය පෙන්වීමෙන් පසු ඔහු වරද පිලිගත්තේය. තානාපති කාර්යාලය තුල සඟවා තබන ලද ලිපිගොනුව එය සඟවා තැබූ තානාපතිවරයාගේ පෞද්ගලික සේවකයෙකුගේ සහය ඇතිව රහස්‍ය සේවා දෙපාර්තමේන්තුව (එස් එස් එස් ඩී) විසින් නැවත සොයා ගන්නා ලදී. රහස්‍ය සේවා දෙපාර්තමේන්තුව (එස් එස් එස් ඩී) විසින් ලිපිගොනුව පරීක්ෂා කිරීමේදී එය තුළ තානාපති කාර්යාලයට යාබද පුද්ගලික ඉඩම්වලට අදාලව තානාපතිවරයාගේ නමින් ඔප්පු කිහිපයක් තිබූ බව හෙළිවිය. මෙම ඔප්පු ව්‍යාජ ලෙස අත්සන් තැබූ ඒවා වේ.

එම අවස්ථාවන් දෙකට අදාල නිතිමය කරුණු සාකච්ජා කරන්න.

04. ලෝටිනන් සහ කබුලියානා අසල්වැසි රාජ්‍ය වේ. ලෝටිනන් ජාතිකයෝ වැඩි පිරිසක් කබුලියානා රාජ්‍යයේ දශක තුනකට වැඩි කාලයක් සේවය කරමින් සිටිති. නවතම සංඛ්‍යා ලේඛණවලට අනුව කබුලියානාවේ රැකියා විරහිත අනුපාතය 30% දක්වා වැඩි වී ඇති බව පෙන්නුම් කෙරෙති. ලෝටිනන් ජනතාවට තම රටේ රැකියා ලබාදීම සම්බන්ධයෙන් කබුලියානා ජනතාව විරෝධය දක්වන අතර එම හේතුවෙන් රටේ තරුණ පිරිස අතර නොසන්සුන් තත්වයක් ඇති වී ඇත. අවස්ථා කිපයකදී කළකෝළහලද ඇති විය.

තත්වය පාලනය කරන ලෙස කබුලියානු ජනාධිපතිවරයා සිය යුධ හමුදාවට අණ කළේය. කෙසේ වුවද හමුදා සොල්දාදුවෝ කැරලිකරුවන්ට පක්ෂපාති වී ලෝටිනන් ජාතිකයන්ගේ දේපළවලට පහර දුන් අතර ඉන් දස දෙනෙකු මිය ගියහ. කැරළිකරුවන්ට සහය දක්වන කබුලියානු රජයේ රාජ්‍ය නිලධාරී පිරිසක් විසින් කබුලියාවේ පිහිටි ලෝටිනන් ආගමික මධ්‍යස්ථානයකට පහර දුන් අතර යුධ හමුදාව ඊට මැදිහත් නොවී බලාසිටියෝය.

ලෝටිනන් පුරවැසියන්ට වූ හානිය සම්බන්ධයෙන් කබුලියාවේ ජාත්‍යන්තර වගකීම අභියෝගයට ලක් කරමින් යුක්ති අධිකරණයට ලෝටිනන් රජය විසින් චෝදනා ඉදිරිපත් කිරීමට සැරසේ. ලොටිනන් රාජ්‍ය තම පුරවැසියන්ට සිදු වූ හානි සම්බන්ධයෙන් වන්දි අයැද සිටී. කෙසේ වුවද මෙම සියළුම චෝදනා ප්‍රතික්ෂේප කරන කබුලියානු රජය තම රාජ්‍යයේ ආයතනයන්හි බලාතික්‍රමණ ක්‍රියාවන් සම්බන්ධයෙන් තමන් වගකීමෙන් නොබැඳෙන බවට තර්ක කරයි.

අ) ලෝටිනන් රාජ්‍යයට උපදෙස් දෙන්න.

ආ) ලෝටිනන් රාජ්‍යයට ඇති ප්‍රතිකර්ම මොනවාද ?

5. පහත සඳහන් ඕනෑම දෙකක් පිළිබඳ සටහන් ලියන්න.

අ) ගැටුම් නිරාකරණය පිළිබඳ අධිකරණ ක්‍රම
ආ) ජාත්‍යන්තර නීතියේ ද්විතික මූලාශ්‍ර
ඇ) භූමියන්හි ස්වාධිපත්‍ය අත්පත් කර ගැනීමේ සම්ප්‍රදායික ක්‍රම
ඈ) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතන

06. අ) "එක් එක් තනි පුද්ගලයන් ජාත්‍යන්තර නීතිය යටතේ විෂය පාත්‍ර පුද්ගලභාවයක් නොමැත්තන් වන අතර තනි පුද්ගලයන්ට සිය රාජ්‍යයේ බැඳීමෙන් වෙන් වූ නෛතික පුද්ගලභාවයක් නොමැත යන්න සාම්ප්‍රදායික මතය වුවද, ජාත්‍යන්තර නීතියේ අවසාන අරමුණ බවට තනි පුද්ගලයා නිරන්තරයෙන් පත් වී ඇති බැවින් එම මතය වෙනස් වී ඇත."

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වේද?
පිළිතුරට හේතු දක්වන්න.

ආ) භෞමික අයිතිවාසිකම් සම්බන්ධව වසර 09 ක පමණ කාලයක් තිස්සේ ලලූකා රාජ්‍ය සහ ඉන්දුනියා ජනරජය යුද්ධයක පැටලී ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මෙම ගැටලුව සමථයකට පත් කිරීම සඳහා මැදිහත් කරුවෙකු ලෙස පිටර් ක්‍රයිසිස් සහ තවත් විශේෂඥයන් තිදෙනෙක් පත් කරනු ලැබ ඇත. පිටර් ක්‍රයිසිස් මේ සඳහා සාම සැලැස්මක් සකස් කළේය. එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පෙර ලලූකා ත්‍රස්තවාදීන් විසින් පිටර් ක්‍රයිසිස් ඝාතනය කරන ලදී. මේ අතර ලලූකා රාජ්‍යය මාධ්‍යයන් විසින් මැදිහත් නියෝජිතයකුට ඉන්දුනියා රාජ්‍ය සමග අවිආයුධ විකිණීම සම්බන්ධව රහස් ගිවිසුමක් ඇති බවට චෝදනා කරනු ලැබීය. තවද ලලූකා රාජ්‍යයේ යුද්ධය පවතින ප්‍රදේශයන්හි ළමයින් අපයෝජනය පිළිබඳ අනෙකුත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයන් දෙදෙනාට විරුද්ධව පොලිසියට පැමිණිලි ලැබී තිබේ.

තම සංවිධානය වෙනුවෙන් පිටර් ක්‍රයිසිස් පවුල වෙනුවෙන් ලලූකා රාජ්‍යයෙන් වන්දි ලබා ගැනීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය අපේක්ෂා කරයි. කෙසේ වුවද තමන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය නොදරන බැවින් වගකීම බාර ගැනීමට ලලූකා රාජ්‍යය

විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය. තවද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයන්ගේ නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ලලුකා රාජ්‍යය වන්දි ඉල්ලා සිටී.

ජාත්‍යන්තර නීතිය යටතේ අදාල පාර්ශවයන්ට ඔවුන්ගේ බැඳීම් සහ වගකීම් සම්බන්ධයෙන් උපදෙස් දෙන්න.

07. අ) "අධිකරණ බලය යනු රාජ්‍යයේ ස්වාධිපත්‍යය සම්බන්ධයෙන් අතිශයින්ම සහ සැබවින්ම මධ්‍යගත ලක්ෂණයකි. මන්ද යත් නෛතික සබඳතා සහ බැඳීම් වෙනස්වීම හෝ අළුත් කිරීම හෝ අවසන් කිරීම, බලය ක්‍රියාත්මක කිරීමේදී සිදුවිය හැකි වන හෙයිනි."

Malcolm N.Shaw, International Law, 5th Edition (2003), at p.572
සාම්ප්‍රදායික අධිකරණ බලයේ මූලිකාංග සැලකිල්ලට ගෙන ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

ආ) උමානා රාජ්‍යයට එරෙහිව කරනු ලැබූ අසාර්ථක කැරැල්ලකින් පසු උමානා රාජ්‍යයේ ප්‍රසිද්ධ කැරලිකරුවකු වන පිටර් සමෙඩි යන අයට රිස්තෝමා රාජ්‍යය විසින් රැකවරණය ලබා දෙන ලදී.

පැහැදිලි ලෙස ද්විත්ව අපරාධ රීතිය අන්තර්ගත වන ද්විපාර්ශවික උදර්පන ගිවිසුම යටතේ පිටර් සමෙඩි උදර්පනය කරන ලෙස උමානා රාජ්‍යය රිස්තෝමා රාජ්‍යයෙන් ඉල්ලා සිටියේය. එම ද්විපාර්ශවික ගිවිසුමේ ද්විත්ව අපරාධ රීතියට අනුව රාජ්‍යයන් දෙකෙන් කවර රාජ්‍යයකට හෝ එරෙහිව කැරලි ගැසීම මරණ දඬුවමෙන් දඬුවම් කළ හැකි වරදකි. හේතු දෙකක් මත පිටර් සමෙඩි උදර්පනය කරන ලෙස ඉල්ලා සිටීමට උමානා රාජ්‍යයට හිමිකම් නොමැති බව රිස්තෝමා රාජ්‍යය තර්ක කරයි. එනම්, (i) රැකවරණ ඉල්ලුම්කරුට එරෙහිව බැලූ බැල්මට පෙනෙන නඩුවක්නොමැති වීම (ii) අදාළ චෝදනාව පැහැදිලිවම දේශපාලන හේතු මත ඇති කරන ලද්දක් වීම වේ.

ජාත්‍යන්තර අධිකරණය ඉදිරියේ උමානා රාජ්‍යය රිස්තෝමාවට එරෙහිව නඩු පැවරීමට බලාපොරොත්තු වේ.

ඉහත සිද්ධියේදී අදාළ වන ජාත්‍යන්තර නීති මූලධර්ම විශ්ලේෂණය කරන්න.
ලංකාවේ උදර්පන නීතිය සමඟ ඔබේ පිළිතුර සංසන්දනය කරන්න.

08. "දේශීය නීතිය තුළට ජාත්‍යන්තර නීති ඇඳා ගැනීමේ පිළිගත් සහ මනා ලෙස හඳුනාගත් න්‍යායන් ජාත්‍යන්තර නීතියේ ඇති නමුත් ලොව නූතන සංවර්ධනය සමඟ පැහැදිලි න්‍යායානුකූල විභේදනයන් ප්‍රායෝගික වශයෙන් නොගැලපීමක් දක්නට ලැබේ."

සාකච්ඡා කරන්න.

හිමිකම් ඇවිරිණි.